3 වන පිටුවෙන් (පාතාලය)

උපයාගැනීමට තමන්ගේ මව වුවද මරාදැමීමට නොපැකිළෙන මොවුන් අතර මෑතකදී විරු නම් වුනාම ලැබූ පුද්ලයෝද සිටීති. ජාතික ගීය අභිමානයෙන් ගායනා කරමින් ජාතිය වනසන මොවුන් රටටම පිළිලයක් වූ එක්තරා පාතාලයකි.

අප රටේ ජාතිවාදී කල්ලි වශයෙන්ද පාතාලයක් බිහිවුයේ යුද්ධය නිසා නොවේ. දේශපාලනය නිසාය. කප්පම් ගැනීම හා කුඩු වෙළඳම හරහා බිහි වූ ලෙයට ලෙය නමැති පළිගැනීම හේතුවෙන් කල්ලි වශයෙන් බිහිවු මෙම පාතාලය වඩාත් සක්‍රිය වුයේ කොළඹ කොස්ගස් හන්දිය කොටහේන ප්‍රදේශ හරහාය. මුස්ලිම් පාතාලය වශයෙන් රට පුරා ප්‍රකට වුයේ මුස්ලිම් දේශපාලඥයන්ගේද අනුග්‍රහය ලබමිනි.

අප රටේ විශ්ව විද්‍යාල අරගලවලදීද වැඩ වර්ජන කඩා කප්පල් කිරීමට ද භීෂණය ක්‍රියාත්මක කිරීමටද දේශපාලඥයන් යොදාගත්තේද දැනටත් යොදාගන්නේද පාතාලයයි. මෑතකදී කැළණි විශ්ව විද්‍යාල සිසුන්ට පහර දී වැඩ වර්ජන කඩාකප්පල් කළේ ද මර්වින් ගේ පාතාලයයි. ඔහු ඒ බව සෘජුවම ප්‍රකාශ කර තිබිණි. එසේම රජයේ ජේෂකර්ම ඇමතිවරයාව සිටින මහින්ද රත්නතිලක ද පොලිසීයට ගොස් පොලිස් නිලධාරීන්ට තර්ජනය කොට තමාට හිතවත් මැරයන් පිරිසක් බේරාගත්තේ රජයේ නායකත්වයටද කළු පැල්ලමක් එකතු කරමිනි. කලින් එජාපයේ සිටි මහින්ද රත්නතිලකගේ නාමය නාලන්ද එල්ලාවල ඝාතනයටද සම්බන්ධය. එහෙත් කෑදර දේශපාලනයට පක්ෂයක් පාටක් ප්‍රතිපත්තියක් කුමකටද යන්න පෙන්වමින් මහින්ද රාජපක්ෂ ඔහුට ඇමති පදවියක්ද පිරිනමමින් රජයට බඳවාගත්තේ කුමක් අරභයාද යන්න ඔහු කරන කෙරුම් වලින් මොනවට පැහැදිලි වේ.

පොලිසියද පාතාලය සමඟ හොඳින් නරකින් දෙකෙන්ම සම්බන්ධකම් පවත්වන්නේ සමහර අවස්ථාවලදී රටේ නීතියද පොලිස් පද්ධතියද පාතාලයට බාරදෙමිනි. එද යු ඇන් පිය රජය සමයේ තම දරුවන්ට ඉහළ පාසැලක් රැකියාවක් ලබාගැනීමට පොලිස් නිලධාරීහු ද ගෝනවල සුනිල් පසු පස ගියහ. ගෝනවල සුනිල් ඝාතනය කරන අවස්ථාවේදී පොලිස් නිලධාරියකුද මිය ගියේ තම දරුවාව පාසැලක් ලබාගන්නට ආ නිසාය. එසේම අනියම් ක්‍රමයෙන් අහිංසකයන් මරා දමා ඔවුන්ට පාතාලයේ ලේබලය අලවා ඉහළ පුටුවලට යන්න දඟලන පොලිස් නිලධාරීන්ද කොටින් සමඟ එකතු වී ලක්ෂ ගණන් මුදල් ලබාගෙන බෝම්බ පුපුරුවන්නට උදව් කළ නිලධාරීන්ද අයිතිවන්නේ පොලිස් පාතාලයටය. පොලිස් පාතාලය ක්‍රියාත්මක වන්නේ ඉහළ නිලධාරීන් ගේද සහයෙනි. සමහර අවස්ථාවලදී කප්පම් වශයෙන් මත්පැන් හා ගණිකාවන් ලැබෙන මොවුන් සමාජයේ පෙනී සිටින්නේ විනය ගරුක නිලධාරීන් වශයෙනි. රජයේම ඇමතිවරයෙකු වූ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතාගේ ඝාතනයට උදව් කළ ලක්ෂමන් කුරේ ඇතුළු හමුදාවේ සමහර ප්‍රධාන පෙළේ ලොක්කන් කිහිප දෙනෙකුද රජයට විරුද්ධව ගෙනගිය පාතාලය සොයාගන්නට හැකිවුයේ රටේම වාසනාවටය. අඟුලාන තරුණයන් දෙදෙනා ඝාතනය කළ නිව්ටන් ප්‍රනාන්දු නමැති පොලිස් නිලධාරියා යුද්ධය පැවති අවධියේ කොපමණ පිරිසක් ඝාතනය කළාදැයි කාට කිව හැකිද? සමහරවිට ගල්කිස්ස ප්‍රදේශයේ තවත් අහිංසක තරුණයින්ද යුද්ධය මුවාවෙන්ම මොහු අතින් ඝාතනය වන්නට ඇත. කොහොමත් අප රටේ පොලීසියට ජාතියක් ජන්මයක් නැත. බොහෝ අවස්ථාවල දී මෙම පොලිසිය ක්‍රියාකර ඇත්තේ කැලෑ නීතිය අතට ගෙනය.

පොලීසිය ගැන කථාකරන විට මාලඹේ තොරතුරු තාක්ෂණ ආයතනයේ සිසුවා පැහැරගෙන ගොස් පහරදීම පිළිබඳව කථා නොකරම බැරි මාතෘකාවකි. ගෝඨාභය රාජපක්ෂ මහතාට අනුව මෙය සුළු සිද්ධියකි. දරුවන් දෙදෙනකු අතර ප්‍රශ්නයකි. මාධ්‍යය මගින් අනවශ්‍ය ලෙස උළුප්පා දැක්වීම නිසා වැඩේ දුරදිග ගිය බව ඔහු ප්‍රකාශ කරයි. රටේ යුද්ධය දිනීමට විශාල දයකත්වයක් සැපයු පොලිසියේ වීර ක්‍රියා කථා කිරීම පසෙක තබා මේවා ගැන පුවත් පත් මගින් කථා කිරීම වැරදි සහගත බව ඔහුගේ අදහසයි. මවක් දරුවෙකු ප්‍රසුත කර එම දරුවාට කිරි පොවා හුරතල් කිරීමටද කාලයක් තිබේ. දරුවා ලොකු මහත් වෙන වෙන විට ඒ වෙනුවෙන් දහසක් රාජකාරී ඇත. ලොකු මහත් වූ දරුවා තවත් උස් මහත් වී සමාජ විරෝධී ක්‍රියාවල යෙදේ නම් මවකට වුවද දරුවා පාවාදීමට සිදුවේ. යුද්ධය දිනු බව ඇත්තය. රට බේරාගත් බව ඇත්තය. නමුත් එය එසේ කළා කියා ඊට පසු කරන වැරදි වලට සමාවක් දීමට හෝ පොලිසියේ ගුණ යහපත් කම් කිය කියා යෑමට ජනතාව කැමති නැත. ඔවුන් ඒවා අනුමත කරන්නේද නැත. අඟුලාන පොලිසියට ගල් ගසා පොලිසියට හිරිහැර කිරීමට ජනතාව පෙළඹුනේ ඒ නිසාය. පොලිසීය ඇත්තේ ජනතාව ආරක්ෂා කිරීමටය. ජනතාව විසින් රයක් පත් කරන්නේද ඒ නිසාය. ඔවුන් ජනතා මුදලින් පඩි නඩි යාන වාහන වරප්‍රසාද ලබන්නේද ඒ නිසාය. මාලඹේ සිසුවා පැහැර ගෙන ගොස් ඇත්තේ වාස් ගුණවර්ධනගේම පොලිසියයි. සිවිල් ඇඳුමින් සැරසී දරුවෙකු පැහැරගැනීම ගැන ආරක්ෂක ලේකම් කථා කරන්නේ නැත. ඔහු පවසන්නේ එය පාතාලය තුළින් මතුවී ආ කුමන්ත්‍රණයක් බවයි. එසේ කුමන්ත්‍රණයක් පැවත එන්නේ නම් එය වන්නේ රජයේම පිරිසක් අතින් විය හැක. මෙම පාතාලය මර්දනය කිරීම ගැන රජයේම සමහර ඇමතිවරු සහ රජයට සම්බන්ධ සමහර මුස්ලිම් ඇමතිවරුද රජය සමඟ සිටින්නේ නෝක්කාඩුවෙනි. ඒ නිසා ඇතුළින් වන කුමන්ත්‍රණවලින් රජය පෙරළීමට වුවද ඔවුනට හැකිවන්නේය. ඒ නිසා වාස් ගුණවර්ධනගේ හොඳ ක්‍රියා මෙන්ම නරක ක්‍රියා ගැනද කථා කිරීමට මාධ්‍යයට අයිතියක් ඇත. යුද්ධයට් වඩා පාතාලය ජය ගැන්මට අසීරු බව ඇඟට දැනෙන විට එය රජයට වුවද දරාගැනීමට බැරි බව අපිට දැනෙන්නේ ඡන්දයක් ලංවන විටය. සමහරුන්ට ඡන්දය දිනාගැනීමට නම් පාතාලය අවශ්‍යමය. තමන්ගේ උන්ම උතුරට ගැහැව්වා සේ ගහලා සුද්ද කිරීමට බැරිය. රජය රැකෙන්නේ උන් නිසාය.

අද සමහර ඇමතිවරු තමන්ගේම නිවෙස්වල හංගාගෙන පිටරට යවන්නට වලිකන පාතාල නායකයන්, තමන්ට සැප සතුට ගෙන දුන්නන් බව එම දේශපාලඥයෝ හොඳින් දනිති. මනාප ඡන්ද ක්‍රමය අනුව පාර්ලිමේන්තුවට යාමට නම් අනිවාර්යයෙන්ම ඡන්ද 60,000 ක් ලබාගත යුතුය. ඡන්ද 60,000ක් තබා එයින් 50% ක් වත් ගන්නට බැරි සමහර පිරිස් අද ආණ්ඩුවට සම්බන්ධ වී ඇත. මර්වින් සිල්වා එයින් එක් අයෙකි. ඔහුට ඡන්දය දිනීමට නම් සයිඩ් සපෝට් පාතාලයක් අවශ්‍යමය. අද බත් පැකට් එකකට ඡන්දය දෙන දායකයන් විරලය. අද ඒ වෙනුවෙන් එක ඡන්දයකට රුපියල් හාරපන්සීයක්වත් වැය කළ යුතු වේ. රාජපක්ෂ ජනාධිපතිවරයා කොළඹ දිස්ත්‍රික්යේ එක්තරා ආසනයට පත්කර ඇත්තේ එවැනි අයෙකි. ඔහුට අතමිට දිගහැර වියදම් කිරීමට මුදල් ඇත. මස්පිඩු නලියන ඇඟලතක් ඇත. සංගීත සංදර්ශන වලට නළු නිළියන් ගායක ගායිකායවන් ගෙන්වා ඡන්දදායකයන් නැටවිය හැකි ය. අතමිට මොළවා පහරදිය හැකි ය. ඔහු ළාබාල දැරියක්ද දුෂණය කර ඇති බව ජනතාව කියයි. විදේශගත අධ්‍යාපනයක් ලැබුවද ඔහුගේ දේශපාලන දැනුම බිංදුවකි. කලක් යු ඇන්පි යේ සිටි ඔහු මහින්දට හේත්තු වුයේ රට ජාතිය ගැන සිතා නොවේ. තමාගේ මල්ලිට අහිමි වෙන්නට ගිය ගුවන් විදුලි නාලිකාව බේරා ගැනීමටය. යුද්ධය ජයග්‍රහණය කිරීමත් සමඟින් රජයට ලංවූ පිරිස දෙස බලනවිට මොවුන් එකල සිටියේ රට ගැන සිතාද නැත්නම් බඩවඩා ගැනීම ගැන සිතාද යන්න අපටද තවමත් ගැටළුවකි.

ආරක්ෂ අංශවලද, දේශපාලනයේද සිටි මෙම පිරිසගේ කටුසු වර්ණ අංජනමක් සේම ජනතාවට පෙනෙන විට ජාතියේ ලේ කැක්කුම හා මුදලේ බලය අතර වෙනස කොතරම් දැයි දැනේ.

බෝධිසත්වයෝ ස්වර්ණ හංසව උපන් සමයේ තම මලණුවන් සමඟ ගොදුරු සොයා යන ගමනේදී සේරු පර්වතය සොයාගත්තේ ගිමන් හරින්නටය. මෙම පර්වත සෙවන යට සිදුවූ අපුරු සිදුවීමක් තුළින් ජාතක කථා සංග්‍රහයේ එන සේරු ජාතකයෙන් අපට වැදගත් පණිවිඩයක් ලබා දෙයි. "අයියණ්ඩි මෙම පර්වත සෙවනට ආ කළ සිංහ ව්‍යාඝ්‍ර සිවල් ඌරු කපුටු ආදී හැම සතෙක්ම රන් පාට වෙයි. නීච සතුන් හා උත්තම සිව්පාවුන් ඇතුලු සතුන් ස්වර්ණ වීම අද්භූතය. නොමනාය. එසේ වීමට හේතු කවරේද?" කියා බෝධිසත්වයන්ගෙන් ඇසුවේය. "මලයණ්ඩි මෙය සේරු රන් පැහැ ගනියි" අයියණ්ඩි උත්තම මධ්‍යම අධම යනුවෙන් තෝරාගැනීමක් නොකට නින්ද වේවා ! කියා එහු පැවසුවේය. දේශපාලනයද සේරු පර්වතය වගේමය එයින් ඉහළට ආ එකා පෙන්නේ එකම වර්ණයකිනි. එහෙත් ඒ වර්ණ ලක්ෂණ හඳුනානොගෙන තමාට ලැදි හැම එකාම එකසේ යැයි සිතන්නට ගියහොත් මහින්ද ගේ දේශපාලන ගමනටද ආයුෂ අඩුය.







